

## ලියා දන්වන වග යි

### අපි

රාජපක්ෂ ආණ්ඩුවේ බොහෝ ක්‍රියාකාරකම් සන්නසේ විවේචනයට බඳුන් වන්නේ මන්දැයි විමසන අපේ පාඨකයන්ට යම් පැහැදිලි කිරීමක් කිරීම සුදුසු යයි අපට සිතෙයි. ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් අහිමි කිරීමේ ක්‍රියාදාමය අපේ අඛණ්ඩ විවේචනයට භාජනය වෙයි. එය හුදු රාජපක්ෂ ආණ්ඩු විරෝධයක් ලෙස අර්ථ දැක්වීම සුදුසු නොවේ. රාජපක්ෂ හෝ වේවා රනිල් හෝ වේවා සෝමවංශ හෝ වේවා වෙනයම් පාලකයකු හෝ වේවා ජනතා විරෝධී මර්දනකාරී පිළිවෙතකට යන්නේ නම් එය අපේ විරෝධයට හේතු වෙයි. අපට ඇත්තේ පුද්ගලයන් හෝ පක්ෂ හෝ පිලිබඳ ගැටළුවක් නොවේ.

මර්ධනය කර විළංගු ලන මාධ්‍ය නිදහස අහිමි වී යමින් තිබෙන මානව අයිතිවාසිකම් දූෂණ වංචා පිළිබඳ වගකිව යුත්තේ රාජපක්ෂ ආණ්ඩුව නම් අපේ විරෝධය ආණ්ඩු විරෝධයක් ලෙස තේරුම් ගැනීමේ වරදක් නැත. අප මේ දුර්දාන්ත ක්‍රියාදාමයට එරෙහි වන විට එය ආණ්ඩු විරෝධයක් ලෙස කෙනෙකු අර්ථ දක්වන්නේ නම් මේ දුර්දාන්ත ක්‍රියාවලියට ආණ්ඩුවේ ඇති සම්බන්ධතාව ඒ පුද්ගලයා විසින් පිලිගනු ලබන බව පැහැදිළි ය.

රටේ සිදුවෙමින් පවතින අනෙකුත් සියල්ල පසෙක ලා මාධ්‍යයට එරෙහි මර්ධනය පමණක්ම ගෙන බලමු. කීත් නොයාර් පෝද්දල ජයන්ත ලසන්ත හරහා එක්නැලිගොඩ දක්වාත් සිරස සියත ලංකා ඊනිව්ස් මාධ්‍ය ආයතන ගිණිතැබීම දක්වාත් නොකඩවා සිදුවෙමින් පවතින මාධ්‍ය මර්ධන ක්‍රියාවලියේ වගකීම එක එල්ලේම රජය දෙසට යොමු වන්නේ ඇයි. අධිකරණය හමුවේ ඔප්පු කිරීමට නොහැකි වුව ද මේ සියල්ල පසුපස සිටින බලවේගය රජය බව මොළය කළදක් හෝ තිබෙන කෙනෙකුට තේරුම් ගැනීම අපහසු නොවේ. ජනමාධ්‍ය කරුවන් පැහැර ගැනීම අතපය කඩා දැමීම අතුරුදන් කිරීම අධි ආරක්ෂක කළාප තුළ දී පවා මාධ්‍ය ආයතන ගිණි තැබීම සිදුකරන්නේ සාමාන්‍ය මැරයන් නොවේ. අනෙක් අතින් තමන් මේ සියල්ලට සම්බන්ධ නැතැයි රජය කියන්නේ නම් මේවා කළවුන් අල්ලා නීතිය හමුවට ගෙනෙන්නට කටයුතු නොයොදන්නේ ඇයි?

මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් වැළලී යමින් තිබෙන විට ඇස් කන් පියාගෙන සිටීමට ජනතාවගේ මාධ්‍යයක් වන අපට හැකියාවක් තිබේ ද? අසාධාරණය අයුක්තිය හමුවේ නිෂ්ශබ්ධව සිටිනවාට වඩා හීන් කෙඳිරියක් හෝ නගන්නට අපි උත්සාහ කරමු. අපි අපේ වගකීම තේරුම් ගෙන සිටින්නෙමු.

### කවරයේ කතාව

සමිති සංවිධාන පදනම් වශයෙන් සියයකට වැඩි සංඛ්‍යාවකට බෙදී සිටින ඔස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකියන් අතර තමන්ට තම පවුලට පමණක් ආදරය කරන තමන්ගේ සුබ සිද්ධිය පමණක් අපේක්ෂා කරන ආත්මාර්ථකාමී මිනිසුන් අතර තමන්ට සේම සමාජයටද ආදරය කරන තමන්ගේ සුබ සිද්ධිය සේම සමාජයේ සුබ සිද්ධියද අපේක්ෂා කරන මිනිසුන් පිරිසක් පිළිබඳ සටහනක් තබන්නට කැමැත්තෙමු. ජාති ආගම් කුල බේධ පසෙක ලා පරාර්ථයෙන් හද පුරවා ගනිමින් සමාජයේ පොදු අවශ්‍යතා හමුවේ නොපැකිළ ඉදිරිපත් වෙමින් මනා ආදර්ශයක් සපයන ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය අපේ පැසසුමට ලක් වෙයි.

තමා ජීවත්වන සමාජයේ වේදනාවනට සංවේදී වෙමින් ක්වීන්ස්ලන්ත ප්‍රාන්තයේ ගං වතුර විපතින් ආනාථ වූ ජනතාව වෙනුවෙන් මහ මගට බැස ආධාර එකතු කර සිය මානුෂිකත්වය ලොවට ප්‍රදර්ශණය කළ මේ සැබෑ මිනිසුන්ට අපි මෙසේ ආචාර කරන්නෙමු. ඔවුන් වෙනුවෙන් මෙවර සන්නස පිටකවරය වෙන් කරන්නේ එනිසා ය.

සන්නස

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .



සංජීව මුණසිංහ

පශ්චාත් යුද ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සංහිඳියාව සහ රාජ්‍යය ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ කතිකාව නැවත වරක් දේශපාලන කරලියේ උණුසුම් මුහුණුවරක් ගනු දැකීම, දේශයේ අනාගත උන්නතිය ගැන හිතන සියලූ පුරවැසියනට සතුටු විය හැකි සංසිද්ධියකි.

මෙම ලිපියෙහි අරමුණ වන්නේ එම කතිකාව පෝෂණය කිරීම සඳහා තවත් කරුණු කිහිපයක් ගැන පාඨක අවධානය යොමු කිරීමයි.

# ශ්‍රී ලංකා රාජ්‍යය ගොඩනැගීමේ අභියෝගය ජයගත හැක්කේ කෙසේද?

*වාර්ගික, ආගමික භේදයකින් තොරව රටේ බහුතර පිරිසක් අද පවතින මේ දේශපාලන, අර්ථ ක්‍රමය ගැන අතෘප්තියෙන් පසුවෙති.*

**හැඳින්වීම**

තිස් අවුරුදු යුද්ධය අවසන, ශ්‍රී ලංකාව ප්‍රධාන අභියෝග දෙකක් අභිමුව සිටී. ඉන් පළමුවැන්න වන්නේ ජනවාර්ගික කණ්ඩායම් අතර සාමය සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම පෙරදැරි කර ගත් ප්‍රතිසන්ධාන ක්‍රියාමාර්ග පූර්ණය කිරීමයි. දෙවැන්න වන්නේ ආර්ථික වශයෙන් රට නඟාසිටුවීම සහ සංවර්ධනයේ ප්‍රතිලාභ සමස්ත මහ ජනතාවට හිමිවන, තිරසර හා ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් බිහි කිරීමයි. සත්‍ය වශයෙන්ම මේ වූ කලී ශ්‍රී ලංකා රාජ්‍යය ගොඩනැඟීමේ ?ඒඑැ ඉමසකාසබට) ප්‍රධාන පැතිකඩ ද්විත්වයයි. දිග් ගැසෙමින් පැවැති සිවිල් යුද්ධය අවසන් කොට ඇති මේ මොහොතේ, මෙම ද්විත්ව අභියෝග ජයගැනීම සඳහා යළිත් උදා නොවන අවස්ථාවක් (ධචචදරඑමබසඑහ) විවර කොට ඇත. දැන් එළැඹ තිබෙන්නේ එම අවස්ථාවෙන් ඵල නෙලා ගත යුතු කාලයයි. මේ, ඒ පිළිබඳව තබන සටහනකි.

ශ්‍රී ලංකාවේ රාජ්‍යය ගොඩනැඟීමේ උත්සාහය සහ එහි ඉතිහාසය

ශ්‍රී ලංකාවේ රාජ්‍යය ගොඩනැඟීම පිළිබඳ කතිකාව දේශපාලන තලයේ පුළුල් හා විවෘත මාතෘකාවක් බවට පත්වන්නේ නිදහසින් පසුව, බලය බෙදීමේ (ඥැඩදකමඑසදබ දෆ ඡදඇර) සංකල්පයක් ද ඒ තුළට සම්මිශ්‍රණය කොට ගෙනයි. එම කතිකාව තුළ කියැවුණේ ශ්‍රී ලංකාවේ ජනවර්ග අතර බරපතල අනන්‍යතා අර්බුදයක් පවතින බවත්, එම අනන්‍යතා අර්බුදයෙහි සාධනීය විපරිවර්තනයක් දැකීම සඳහා කිසියම් ආකාර බලය බෙදීමේ සිද්ධාන්ත පාදක කොට ගත් පිළිවෙලකට ශ්‍රී ලංකා රාජ්‍යය ප්‍රතිසංවිධානය විය යුතු බවත්ය.

මේ නිසා නිදහසින් පසුව රටේ බලයට පත් වූ සෑම පාලකයෙක්ම පාහේ රාජ්‍යය ගොඩනැඟීමේ උත්සාහයන්හි දී බලය බෙදීම පිළිබඳ සංකල්පය කෙරෙහි වඩවඩාත් නැඹුරු වන්නට වූහ. 1957 දී ඇති කරගත් බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම මඟින් ද, 1965 දී ඇති කර ගත් ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුම මඟින් ද උත්සාහ ගත්තේ බලය බෙදාහදා ගැනීම සඳහා වූ වඩාත් යෝග්‍ය ආකෘතියක් (එදාැක) හඳුනා ගැනීමටයි. බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම මඟින් ප්‍රාදේශීය ස්වයං පාලනය සහතික කරනු ලබන රට සභා ක්‍රමයක් යෝජනා කෙරුණු අතර ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුම මඟින් දිස්ත්‍රික් සභා ක්‍රමයක් යෝජනා කෙරිණ. එහෙත් එම යෝජනා දෙකම ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂවල මැදිහත්වීම හේතු කොට ගෙන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

1980 දශකයේ අගභාගයේ දී නැවතත් බලය බෙදීම පිළිබඳ කතිකාව දේශපාලන කරලියට පැමිණෙන අතර දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 1987 දී එක්කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව -පළාත් සභා" ස්ථාපිත කෙරුණේ එම සාකච්ඡාවල ප්‍රතිඵලයක් හැටියටයි. උතුරු නැගෙනහිර ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් එමඟින් යෝජනා කෙරිණ. එහෙත් ආරම්භයේ සිටම පළාත් සභා ක්‍රමය අසාර්ථක එකක් බවට විවේචන එල්ල වීමට පටන් ගැණුනු අතර එයට එරෙහිව රට පුරා උද්ඝෝෂණ ව්‍යාපාර දියත් කෙරිණ. පළාත් සභා සංස්ථාපනය කොට ක්‍රියාත්මක කිරීමේ දී එහි භාවිතාවේ දක්නට ලැබුණු සුවිශේෂ දුර්වලතාවය වන්නේ එය උතුරු හා නැගෙනහිර පළාත්වලම ක්‍රියාත්මක නොවීමයි.

පළාත් සභා සංස්ථාපනය කිරීමෙන් පසුව ද බලය බෙදාහැරීමේ අවශ්‍යතාව ගැන සමාජය තුළ කතිකා-වක් ගොඩනැඟිණ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය බලයට පත්වීමෙන් අනතුරුව ඇය මෙම කතිකාව සැලකිල්ලට භාජනය කළාය. ඒ අනුව 1995 දී එවකට පැවැති පොදුජන එක්සත් පෙරමුණු රජය විසින් බලය බෙදාහැරීම සඳහා වන යෝජනාවලියක් ඉදිරිපත් කළේය. එහෙත් එම යෝජනාවලිය බලාත්මක කිරීමට බලයේ සිටි පොදුජන එක්සත් පෙරමුණු රජය සමත් වූයේ නැත.

වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා බලයට පත්වීමෙන් පසුව බලය බෙදාහැරීම සහ රාජ්‍යය ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ කතිකාව නැවත වරක් දේශපාලන කරලියට පැමිණෙන ආකාරයක් දැකගත

12 වන පිටට


Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241 **after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**උපදේශක සංස්කාරක / Advisory Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**ඡායා රූ / Photography**
ප්‍රසන්න කුරුකුලරත්න Prasanna Kurukularatna

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**SA**
Chandra Eeriyagama
08 8331 2318

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**ACT**
Asoka Nimalasiri
0400 429 031